පේරාදෙණිය විශ්වවිද්‍යාලය
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර)-2020 (නොවැම්බර්, 2021)

# බෞද්ධ සංස්කෘතිය-I

## BCG –I: නිර්දිෂ්ට ග්‍රන්ථ

ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.) කාලය පැය 03 කි.

---

1. බ්‍රාහ්මණ වර්ණ භේදවාදය බුදුසමයේ විවේචනයට ලක්වීමේ හේතු සාකච්ඡා කරන්න.

2. මානව සමාජයේ ප්‍රභවය පිළිබඳව අග්ගඤ්ඤ සූත්‍රය මගින් ඉදිරිපත් කෙරෙන මතය පැහැදිලි කරන්න.

3. යාගය පිළිබඳ බ්‍රාහ්මණික අදහස බුදුරජාණන් වහන්සේගේ විචාරයට ලක්වූ ආකාරය විමර්ශනය කරන්න.

4. කූටදන්ත සූත්‍රයේ ඉදිරිපත් කෙරෙන බෞද්ධ ආර්ථික ක්‍රමය සමාජ සංවර්ධනය සඳහා උපයෝගී කරගත හැකි ආකාරය ප්‍රකට කරන්න.

5. අබ්‍රහ්මචරියවාස නමින් සන්දක සූත්‍රයෙහි හඳුන්වනු ලබන දෘෂ්ටීන් එසේ හඳුන්වා දීමට හේතු කවරේ දැයි පැහැදිලි කරන්න.

6. ''අනුස්සව'' ප්‍රමාණය පැහැදිලි කර සතෝක්ෂණයේ දී එය විවේචනයට ලක් වන්නේ කුමන හේතු නිසා දැයි බෞද්ධ සූත්‍ර ඇසුරෙන් නිර්ණය කරන්න.

අනෙක් පිටුවට ...

7. කකචූපම සූත්‍රයේ ඇතුළත් වේදේහිකා කථාව තුළින් ඇතැම් සමාජ සංසිද්ධීන් හඳුනාගත යුතු ආකාරය සාකච්ඡා කරන්න.

8. කකචූපම සූත්‍රය මගින් බෞද්ධ භික්ෂු ජීවිතයේ ආධ්‍යාත්මික සංවර්ධනය ගොඩනගා ගත යුතු ආකාරය පැහැදිලි කරන්න.

9. සුඛාවතී ව්‍යූහ සූත්‍රය මගින් ප්‍රකට කෙරෙන අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්ගේ පෞරුෂීය ලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න.

10. "සුඛ සාර්වභෞමික ලෝකයක් පිළිබඳ අදහස බුද්ධත්වය සමඟ සම්බන්ධ කිරීම සුඛාවතී ව්‍යූහ සූත්‍ර දේශනාවේ අරමුණයි." පැහැදිලි කරන්න.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL - OLD SYLLABUS) 2020

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර - පැරණි නිර්දේශය) - 2020

**බෞද්ධ සංස්කෘතිය - 11/ Buddhist Culture - II/ (BCG -11)**

**(බෞද්ධ ආචාර්යවාද)**

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.)

(කාලය : පැය තුනයි)

---

1. "ධර්ම සංගායනා ශාසනයෙහි චිර පැවැත්ම සඳහා හේතු විය." විමසන්න.

2. සිව්වන ධර්ම සංගායනාවට පාදක වූ හේතුන් හා එහි ප්‍රතිඵල පිළිබඳ තර්කානුකූල විමසීමක් කරන්න.

3. සංඝ සමාජය තුළ සිදු වූ නිකාය භේදයෙහි ආරම්භය හා ව්‍යාප්තිය පැහැදිලි කරන්න.

4. සර්වාස්තිවාදී දාර්ශනික සම්ප්‍රදායෙහි එන මූලික ඉගැන්වීම් සාකච්ඡා කරන්න.

5. යෝගාචාර දර්ශන සම්ප්‍රදාය හඳුන්වා එම සම්ප්‍රදායෙහි වර්ධනය සඳහා තත් ආචාර්යවරුන්ගෙන් සිදු වූ සේවය ඇගයීමකට ලක් කරන්න.

6. යෝගාචාර සම්ප්‍රදායේ විඥානය පිළිබඳ ඉගැන්වීම ගෙනහැර දක්වා ආලයවිඥානය හා කර්මය යන ඉගැන්වීම් අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරන්න.

7. සර්වාස්තිවාද අභිධර්ම සම්ප්‍රදාය හා එහි මූලික ඉගැන්වීම් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

**අනෙක් පිටුවට ...**

8. බුදුන් වහන්සේ පිළිබඳ ත්‍රිකාය සංකල්පයක් මහායාන සම්ප්‍රදාය තුළ ක්‍රමයෙන් බිහි වූ ආකාරය පිළිබඳ විමසීමක් කරන්න.

9. සෞත්‍රාන්තික දාර්ශනික සම්ප්‍රදායෙහි මූලික ඉගැන්වීම් පැහැදිලි කර අනුමානය පිළිබඳ විමසීමක් කරන්න.

10. පහත මාතෘකා **හතරක්** සඳහා කෙටි සටහන් ලියන්න.

අ. මධ්‍යමික දාර්ශනික සම්ප්‍රදාය

ආ. ශූන්‍යතා දර්ශනය

ඇ. ආචාර්ය වසුබන්ධු

ඈ. ක්ෂණිකවාද සංකල්පය

ඉ. බෝධිසත්ත්ව සංකල්පය

==========

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERALDEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2021

ශාස්ත්‍රවේදී සමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) -2021

BUDDHIST PHILOSOPHY - III / බෞද්ධ දර්ශනය- III - BPG - 3
(පාරභෞතික විද්‍යාව හා ඥානමීමාංසාව)

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි. (කාලය පැය තුනයි.)

---

1. පුරාතන ඉන්දියාවේ ආගමික සම්ප්‍රදායයන් මගින් යථාර්ථයේ ස්වභාවය පිළිබඳ නිගමනයන්ට පැමිණීමේදී යොදාගන්නා ලද ඥානවිභාගවාදී ප්‍රමාණ පිරික්සන්න.

2. යථාර්ථය පිළිබඳ ප්‍රමාණවත් ඥානයක් තර්කය මගින් පමණක් ලද හැකිය යන මතය බුදුසමයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබෙන්නේ කුමන දාර්ශනික පදනමක් මතද යන්න පැහැදිලි කරන්න.

3. බුදුසමය ඥාන විභාගයේදී ඉන්ද්‍රිය ඥානය සියලු ඥානයේ මූලික පදනම වශයෙන් යොදාගෙන ඇති අයුරු සූත්‍ර දේශනා ආශ්‍රයෙන් පිරික්සන්න.

4. බෞද්ධ ඉගැන්වීම් තුළ ස්වච්ඡන්දතාවට හිමිවන ස්ථානය පැහැදිලි කරන්න.

5. භාරතීය දර්ශනයේ සාකච්ඡාවට භාජනයව ඇති ආත්ම සංකල්පය පිළිබඳ විස්තරයක් සපයන්න.

6. බුදුන් වහන්සේ අනාත්ම ඉගැන්වීම පැහැදිලි කිරීමේදී සංස්ලේෂණ හා විශ්ලේෂණ ක්‍රම යොදාගත් අයුරු පැහැදිලි කරන්න.

7. බෞද්ධ කර්ම දර්ශනය පාරභෞතික විද්‍යාවක් වශයෙන් හඳුන්වාදීමේ යුක්ති යුක්ත බව සාකච්ඡා කරන්න.

අනෙක් පිටුවට...

8. දුක්ඛ සම්භවය පිළිබඳ හේතුඵල පදනම පිරික්සන්න.

9. නිර්වාණය පරම සැපතක් වශයෙන් නිර්ණය කළ හැක්කේ කුමන හේතු සාධක අනුවදැයි පැහැදිලි කරන්න.

10. බුදුරජාණන් වහන්සේ අව්‍යාකත ප්‍රශ්න ලෙස සලකා බැහැර කළ ප්‍රශ්න 10 හඳුන්වා දී ඒවා එසේ බැහැර කළේ මක්නිසාදැයි පෙන්වා දෙන්න.

=============